නුඹලාට කුමක් වීද? වීදිවල වාඩී වී කතා කරන සභාවන්ට කුමක් වීද? වීදිවල වාඩිවී කතා කරන සභාවන්ගෙන් ඔබ වැළකී සිටින්න.

අබූ තල්හා සෙයිද් ඉබ්නු සහ්ල් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. අපි මිදුලේ වාඩි වී එහි කතා කරමින් සිටියෙමු. එවිට අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැමිණ අප ඉදිරියේ නැගී සිට මෙසේ පවසා සිටියහ: ((නුඹලාට කුමක් වීද? වීදිවල වාඩී වී කතා කරන සභාවන්ට කුමක් වීද? වීදිවල වාඩිවී කතා කරන සභාවන්ගෙන්
ඔබ වැළකී සිටින්න.)) එවිට අපි වාඩි වි සිටිනුයේ අවශ්යතාවක් තොර දෙයකට නොවේ අපි
එසේ වාඩි වූයේ එකිනෙකා මෙනෙහි කර ගනිමින් කතා කරන්නටය යැයි පැවසුවෙමු. එවිට එතුමා: ((එසේ නොකරන්නේ නම්, ඔබ එහි අයිතිය එයට දෙනු. එනම්: බැල්ම පහත හෙළීමත් සලාමයට පිළිතුරු සැපයීමත් ප්රියවදනින් කතා කිරීමත් වේ.) [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

ගේ මිදුලේ වාඩිවී තම තමන්ගේ කරුණු සම්බන්ධයෙන් ඔවුන් කතා කරමින් සිටියදී අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා ඔවුන් වෙත පැමිණ, එනම්: එතුමා ඔවුන් ඉදිරියට පැමිණ ඔවුන් අභියස සිටගෙන මාර්ගයන්හි වාඩි වීමෙන් ඔවුන් වැළැක්වූ බව අබූ තල්හා - රළියල්ලාහු අන්හු- තුමා දන්වා සිටියි. අපි වාඩි වි සිටිනුයේ අවශ්යතාවක් නැති දෙයකට නොවේ අපි එසේ වාඩි වූයේ එකිනෙකා මෙනෙහි කර ගනිමින් කතා කරන්නටය යැයි ඔවුහු පැවසූහ. එනම්: අල්ලාහ්ගේ දූතයාණනි, අපි මෙහි වාඩි වී සිටින්නේ ආගමික කටයුතු ගැන කතා කිරීමට නොව, අප අතර තිබූ අපගේ අනුමත කරුණු සම්බන්ධයෙන් මතක් කොට කතා කිරීමට යැයි පවසා සිටියහ. එතුමා: එසේ නොකරන්නේ නම්, ඔබ එහි අයිතිය එයට දෙනු. යැයි පවසා සිටියහ. එනම් ඔබ එම සභාවන් අතහැර දැමීමට ප්රතික්ෂේප කරන්නෙහු නම් මාර්ගයට හිමි අයිතිය දෙනු යැයි පැවසූහ. තවත් වාර්තාවක, ඔවුහු එතුමාගෙන් මාර්ගය සතු වගකීම් මොනවාදැයි අසා සිටි බවට වාර්තා වේ. එවිට එතුමා: බැල්ම පහත හෙළීමත් හානිදායක දෑ ඉවත් කිරීමත් සලාමයට පිළිතුරු සැපයීමත් යහපත විධානය කොට අයහපත් දැයින් වැළැක්වීමත් වේ යැයි පැවසූහ. එහි අර්ථය: මාර්ගයේ වාඩි නොවීම ගැන ඔබ ප්රතික්ෂේප කරන්නෙහු නම් ඔබට අනිවාර්යය වූ දෑ ඉටු කිරීම ඔබේ වගකීමකි යන්න දැන ගත යුතු බවය. පසුව එතුමා මාර්ගයේ වාඩිවීමෙන් වැළැක්වීමට හේතු වූ සාධක පැහැදිලි කර සිටියහ. එනම් තරුණ කාන්තාවන්ගේ පැමිණීම හේතුවෙන් හා ඔවුන් දෙස බලන්නට සිදුවීමෙන් එකතු වන්නා වූ පාපයේ භයානක කම නිසා අර්බුදයට භාජනය වන බව පැහැදිලි කළහ. අර්බුදයට ඔවුන් හේතු වන්නේය. එමනේම තම නිවසේ තනිව සිටින විට හෝ තමන් වෙත පැවරුණු රාජකාරියක නිරතව සිටින විට මිනිසාට නොපැවරෙන වගකීම් මෙහිදී පැවරෙන්නේය. එවිට අල්ලාහ් හා මුස්ලිම්වරුන් කළ යුතු වගකීම් පැහැර හරින්නට සිදු වන්නේය. මෙකී තත්ත්වයන් මත යහපත විධානය කොට අයහපතින් වැළැක්වීම අනිවාර්යය වේ. ඔහු එය අතහැර දැමුවේ නම් සැබැවින්ම අල්ලාහ්ගේ පාපයට ලක් වන්නේය. එමෙන්ම එහි ගමන් කරමින් සලාම් පවසන්නාටද මොහු බලපෑමක් වන්නේය. ඇතැම් විට ඔහු කෙරෙහි සලාම් පැවසීම අධික වෙයි. ගමන් කරන සියලු දෙනාටම සලාම් පැවසීමට නොහැකි කාර්යයකි. සලාමයට පිළිතුරු දීම අනිවාර්යය.එසේ නොකළ විට ඔහු පාපියකු බවට පත් වෙයි. එහෙයින් අර්බුදකාරී තත්ත්වයන් අනාවරණය නොකළ යුතු යැයි ද තමන්ට ඉටු කළ නොහැකි දෙයක් තමන් වෙත පවරා ගත යුතු නැතැයි ද අණ කරනු ලැබ ඇත.